**ශීර්ෂය 152 - වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුව පිළිබඳව විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයහි හා 2 ඡේදයෙහි වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට එක් එක් ශීර්ෂයට අදාළ විගණන නිරීක්ෂණ දැක්වේ.

**1 අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුව**

| ශීර්ෂය | දෙපාර්තමේන්තුව |
|---|---|
| 282 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |

**1.1 විගණන විෂය පථය**

ඉහත 1 ඡේදයේ සඳහන් වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තා පහත සඳහන් දිනවල එම අමාත්‍යාංශයේ ලේකම්වරයාට හා දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

| ශීර්ෂය | අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | කළමනාකරණ විගණන වාර්තාව නිකුත් කළ දිනය |
|---|---|---|
| 152 | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය | 2015 අගෝස්තු 14 |
| 282 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 2015 සැප්තැම්බර් 04 |

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දිමේ නිලධාරිගේ වගකීම**

---

විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම්**

----------------

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

----------------------------

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 50,120 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට ඉන් රු.මිලියන 44,942 ක් උපයෝජනය කර තිබීමෙන් අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් පිළිවෙළින් රු.මිලියන 5,162.0 ක් හා රු. මිලියන 16.3 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 13.9 ක් හා සියයට 0.1 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 152 | 37,257.1 | 32,095.1 | 5,162.0 | 13.9 |
| 282 | 12,863.3 | 12,847.0 | 16.3 | 0.1 |
| **එකතුව** | **50,120.4** | **44,942.1** | **5,178.3** | **10.3** |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන්ට වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවක් විසින් එකතුව රු.මිලියන 1,378 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර එයින් රු.මිලියන 976 ක් උපයෝජනය කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| ප්‍රතිපාදන ලබාගත් දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදන ලබා දුන් අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | 2014 දෙසැම්බර් 31 දිනට | | |
|---|---|---|---|---|
| | | ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය |
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| වාරිමාර්ග දෙපාර්තමේන්තුව | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය | 1,343 | 965 | 378 |
| | ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය | 6 | 6 | - |
| | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | 24 | 4 | 20 |
| | වනජීවී දෙපාර්තමේන්තුව | 5 | 1 | 4 |
| | **එකතුව** | **1,378** | **976** | **402** |

**2.2 අත්තිකාරම් ගිණුම්**

**2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවට අදාළව සමාලෝචිත වර්ෂයේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 15201 | 10.0 | 9.8 | 6.0 | 7.6 | 36.0 | 31.5 |
| 28201 | 130.0 | 120.0 | 97.0 | 99.0 | 500.0 | 359.0 |

## 2.3 අග්‍රිම ගිණුම්

------------

අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂය රු.මිලියන 4 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම්

------------------------

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන 576 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු.මිලියන |
| වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය | 6000/0000/00/0015/0063/000 | 37 |
| වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 6000/0000/00/0001/0022/000 | 11 |
| | 6000/0000/00/0015/0137/000 | 528 |
| **එකතුව** | | **576** |

## 2.5 විගණන නිරීක්ෂණය

---------------------

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව අමාත්‍යාංශයේ හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවල සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවල ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සිට දක්වා ඇත.

**3. ශීර්ෂය 152 - වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය**

**3.1 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|
| හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | පවත්වා නොතිබුණි. |
| බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 | ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| දෙපාර්තමේන්තු විසර්ජන (සම්මත වැය) ලෙජරය | මුදල් රෙගුලාසි 447 | යාවත්කාලීන කර නොතිබුණි. |

3.2 **විගණන සාක්ෂි නොවීම**

ගෙවීම් වවුචර්, ඉඩම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ බදු ඔප්පුව ආදී වූ අවශ්‍ය සාක්ෂි අමාත්‍යාංශයෙහි නොතිබීම නිසා එකතුව රු.6,336,539 ක ට අදාළ වූ ගනුදෙනු 33 ක් විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කළ නොහැකි විය.

3.3 **විගණන විමසුම්වලට පිළිතුරු දීම**

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශයට ඉදිරිපත් කළ විගණන විමසුම් 08 කට සහ ඉකුත් වර්ෂවලදී නිකුත් කළ විගණන විමසුම් 04 කට 2015 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

**3.4 විසර්ජන ගිණුම**

**අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයක් සඳහා සළසා තිබුණු රු. 350,000,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ii) වැය විෂයයන් 28 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම නිසා එම ප්‍රතිපාදන උපයෝජනය කළ පසු එකතුව රු.4,477,253,220 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එය සළසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 7 ක සිට සියයට 96 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**3.5 පොදු තැන්පත් ගිණුම**

----------------------

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

**(අ)** වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.3,465,569 ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ලේඛනය සහ භාණ්ඩාගාර පොදු තැන්පත් ගිණුමේ ශේෂයේ රු.501,852 ක වෙනසක් පැවැතුණත්, මුදල් රෙගුලාසි 427 ප්‍රකාර සසඳා 2014 දෙසැම්බර් 31 දින වන විටත් නිවැරදි කර නොතිබුණි.

**3.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

---------------------------------------------------------------

විෂය අංක 15201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.1,972,141 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 1 සිට වර්ෂ 19 ක් දක්වා කාල පරාසයක් ගත වී තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) අමාත්‍යාංශය විසින් මුදල් රෙගුලාසි ප්‍රකාරව පවත්වා ගෙන යනු ලබන ණය හා අත්තිකාරම් ශේෂ දැක්වෙන කේවල ගිණුම් ශේෂ ලේඛනය සහ සැසඳුම් ප්‍රකාශයේ උපලේඛන අතර රු.434,066 ක වෙනසක් පැවැතුණි.

(ඇ) සාමාජික ණය ලේඛන පවත්වා ගෙනයාමේදී අපැහැදිලි ලෙස ලියාතිබීම, අධිකාරී බලයකින් තොර වෙනස් කිරීම්, මකන තීන්ත යොදාගෙන වෙනස් කිරීම, එක මත එක ලියා තිබීම යනාදිය පැවැතුණි.

**(ඈ)** සැසඳුම් ප්‍රකාශය සමඟ ඉදිරිපත් කළ ණය උපලේඛනය සහ ණය ලේඛනය අනුව ශේෂයන්හි සැලකිය යුතු වෙනස්කම් පැවැතුණි.

**3.7 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**3.7.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට අදාළ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2014 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**3.7.2 විගණන හා කළමනාකරණ කමිටුව**

නියමිත පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා තිබුණද විගණනය විසින් පෙන්වාදුන් අඩුපාඩු නිවැරදි කර නොතිබුණි.

**3.8 වත්කම් කළමනාකරණය**

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ පැවති මඩාටුගම හා තඹුත්තේගම යාන්ත්‍රික වැඩපලවල්වල අලුත්වැඩියා කළ නොහැකි තත්ත්වයේ වාහන පිළිවෙළින් 17 ක් හා 09 ක් පැවති නමුත් එම වාහනද ඊට අමතරව හඳුනා ගැනීම අපහසු බවුසර්, ට්‍රැක්ටර්, ට්‍රේලර් හා යන්ත්‍රෝපකරණ අපහරණය කිරීමට අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබුණි. මෙම වාහන නිෂ්ක්‍රීයව පැවති කාලය පිළිබඳ තොරතුරුද යාන්ත්‍රික වැඩපලෙහි නොතිබුණි.

(ii) යෝගට් නිෂ්පාදන ඒකකයක් මිලදීගෙන නිරාවිය ගොවිපලේ 2013 නොවැම්බර් 26 දින සවිකර තිබුණද, එම යන්ත්‍රයෙන් කිසිදු නිෂ්පාදනයක් 2014 මැයි 22 දින වන විටත් සිදුකර නොතිබුණි. එම යන්ත්‍රය සඳහා වන රු.3,224,636 ක් වූ දෙවන වාරිකය සමාලෝචිත වර්ෂයේදී සැපයුම්කරුට ගෙවා තිබුණු අතර රු.2,099,994 ක රැඳවුම් මුදල් 2014 දෙසැම්බර් 31 දින වන විට ගෙවිය යුතුව තිබුණි. මෙම යන්ත්‍රාගාරය සවි කළ ගොවිපල ශ්‍රී ලංකා මහවැලි සංවර්ධන අධිකාරියට අයත් බැවින් වර්තමානයේ එම අධිකාරිය

වෙනත් අමාත්‍යාංශයක් යටතේ පවතින නිසා මෙම ආයෝජනයේ ඉදිරි පැවැත්ම මතභේදයට තුඩුදෙන්නක් විය.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේ වාර්තා 2015 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යාංශය 2015 මැයි 31 දින වන විටත් එම වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2015 ජූනි 18 දින විගණනයට ඉදිරිපත් කර තිබුණත් අමාත්‍යාංශයට අයත් උප කාර්යාල ඒකක, අංශ, යාන්ත්‍රික වැඩපලවල් හා ගොවිපලවල් සියල්ල ආවරණය වන පරිදි එය සිදුකර නොතිබුණි.

**(ඇ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

අමාත්‍යාංශය විසින් ඇතැම් වත්කම් අවිධිමත් ලෙස බාහිර පාර්ශවයන් වෙත මුදාහැර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| වත්කම් වර්ගය | වත්කම් සංඛ්‍යාව | වත්කම් ලබා දී ඇති ආයතනය | වටිනාකම | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|
| | | | රු. | |
| ජල බවුසර් | 06 | මඩාටුගම යාන්ත්‍රික වැඩපල | 22,780,500 | 2013 වර්ෂයේ සිට |
| විදුලි උත්පාදක යන්ත්‍ර | 01 | මඩාටුගම යාන්ත්‍රික වැඩපල | 2,352,000 | 2013 වර්ෂයේ සිට |

**(ඈ) බේරුම් නොකළ බැරකම්**

විසර්ජන ගිණුම අනුව අමාත්‍යාංශය විසින් 2014 දෙසැම්බර් 31 දිනට වර්ෂයකට අඩු කාලයක සිට පැවැත එන බේරුම් නොකළ රු.2,929,830,590 ක බැරකම් පැවැතුණි. විසර්ජන ගිණුමේ රු.3,082,276,046 ක බැරකම් සඳහන් කර නොතිබුණි.

**3.9 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ව්‍යවස්ථාපිත විධිවිධාන** | | |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 65(1) , 66(2) , 138(1) හා 227 | 138,667,354 | මූලධන ප්‍රතිපාදන, පුනරාවර්තන වියදම් සඳහා යොදා ගෙන තිබුණි. එමෙන්ම පුනරාවර්තන වියදම් මූලධන වැය ලෙස ගිණුම් සාරාංශ මඟින් භාණ්ඩාගාරයට වාර්තා කර තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 94 | 2,895,768,732 | වැය විෂයයන් 27 ක් සඳහා සළසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් උපයෝජනයන් කළ පසු ඉතිරිය ඉක්මවා රු.2,895,768,732 ක බැරකම්වලට එළඹ තිබුණි. |
| **(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| 1995 ජූලි 14 දිනැති අංක 24/95 දරන චක්‍රලේඛය | - | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රියදුරු තනතුරු 75 කට පුද්ගලයන් බඳවා ගැනීමේදී ලකුණු ලබා දෙන ක්‍රමය අයදුම්පත් කැඳවනු ලබන අවස්ථාවේදී ප්‍රකාශයට පත්කර නොතිබුණි. |

(ඇ) **කළමනාකරණ සේවා චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන චක්‍රලේඛය. | 630,000 | චක්‍රලේඛය ප්‍රකාරව ව්‍යාපෘති කාර්ය මණ්ඩලයට වැටුප් ගෙවීමේදී එම ව්‍යාපෘතිය සක්‍රීයව පැවතිය යුතු වුවත් නිවත්කම් දනන් වත්කම් දියුණුව හා සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය (PEACE) 2013 මැයි මාසයේදී අවසන් වීමෙන් පසුවත් එහි ගණකාධිකාරීවරු දෙදෙනාට අමාත්‍යාංශ ප්‍රතිපාදනවලින් මාස 03 කට වැටුප් ගෙවා තිබුණි. |

## 3.10 විදේශාධාර ව්‍යාපෘති

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් විදේශ මූල්‍යනය යටතේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති 06 ක ඇස්තමේන්තුගත පිරිවැය එකතුව රු.72,216,500,000 ක් වූ අතර, එම ව්‍යාපෘති වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.24,347,973,680 ක් උපයෝජනය කර තිබීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **ව්‍යාපෘති බැංකු ගිණුම් වසා නොදැමීම**

2013 මැයි මාසයේදී ඇවර කර තිබුණු නිවත්කම් දනන් වත්කම් දියුණුව හා සවි බලගැන්වීමේ ව්‍යාපෘතිය (PEACE) විසින් ලංකා බැංකුවේ පවත්වාගෙන ගිය බැංකු ජංගම ගිණුම සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් වසා දමා නොතිබුණි.

(ආ) **විදේශ ආධාර ව්‍යාපෘති ඇවර කිරීම**

නිවත්කම් දනන් වත්කම් දියුණුව හා සවි බලගැන්වීමේ ව්‍යාපෘතිය (PEACE) 2013 මැයි මාසයේ ඇවර කර තිබුණද ගිණුම් සකස් කිරීමේ, කාර්යසාධනයේ සහ ඇවර කිරීම සම්බන්ධව ඉදිරිපත් වී තිබුණු ප්‍රමාණාත්මක විගණන නිරීක්ෂණ හේතු කොටගෙන 2012 සහ 2013 යන වර්ෂය සඳහා ගෙවීම්වලින් නිදහස් සහතික නිකුත් කිරීමට විගණකාධිපතිට නොහැකි වී තිබුණි.

**(ඇ) වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලැසුම්කරණ ව්‍යාපෘතිය**

---

මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 4406-CE දරන මූල්‍ය ගිවිසුමේ තුන්වන කොටසේ ඒ, බී හා සී පරිදි ව්‍යාපෘතිය විසින් පිළියෙල කළ යුතු වූ ජාතික ජල භාවිත සැලැස්ම, යාවත්කාලීන කරන ලද මහවැලි ජල සම්පත් සංවර්ධන සැලැස්ම හා මුන්දෙනිආරු ද්‍රෝණි සංවර්ධන සැලැස්ම යන සංවර්ධන සැලැසුම් ව්‍යාපෘතිය විසින් රු.මිලියන 479 පිරිවැයකට 2013 වර්ෂයේදී උපදේශකවරුන් මඟින් පිළියෙල කර අවසන් කර තිබුණද, එම සැලැසුම් ක්‍රියාත්මක තත්ත්වයට පත් කිරීමට අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීමට 2015 මැයි 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ii) ජලාශ 32 ක වේලිවල පිළියම් වැඩ සඳහා ඇස්තමේන්තු පිළියෙල කිරීම සඳහා රු.මිලියන 491 ක ඇස්තමේන්තුගත පිරිවැයකට විදේශීය උපදේශක සමාගමකට ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණු අතර, උපදේශක සමාගම විසින් එකඟවූ පරිදි ඒ පිළිබඳ පිරිවැය ඇස්තමේන්තු පිළිබඳ වාර්තා ඉදිරිපත් කර තිබුණි. කෙසේ වූවද, එම ඇස්තමේන්තුවට අමතරව රු.මිලියන 612.7 ක් වූ වේලි පිළිබඳ අතිරේක වැඩ ව්‍යාපෘතිය විසින් පසුව හඳුනාගෙන තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපෘතිය විසින් රු. මිලියන 170.4 ක පිරිවැයකට එක්ස්කැවේටර් 03 ක්, ටිපර් 08 ක් හා ඒරියල් ප්ලැට්ෆෝම් යන්ත්‍ර 03 ක් ප්‍රසම්පාදනය කර තිබුණු බව නිරීක්ෂණය විය. මෙම යන්ත්‍රවල තාක්ෂණ පිරිවිතරයන් තීරණය කිරීමට පෙර එම යන්ත්‍රවලින් අරමුණු කළ උපයෝජනයන් විධිමත්ව හඳුනාගෙන නොතිබුණි. එම යන්ත්‍ර ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ උපයෝජනය සඳහා ලබාදී තිබුණු නමුත්, ඒවා ඌන උපයෝජිතව පැවති බව නිරීක්ෂණය විය.

(iv) නාලන්දා වේල්ලේ පිළියම් වැඩ සඳහා රු.මිලියන 382.99 ක ඇස්තමේන්තුගත පිරිවැයකට 2013 මැයි 28 දින ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්තුව පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- පිරිවැය ඇස්තමේන්තුව අනුව නාලන්දා වේල්ලේ පිළියම් වැඩ පිළිබඳ මුළු පිරිවැය රු.මිලියන 267.9 ක් වී තිබුණි. කෙසේ වූවද, 2013 මැයි 28

දින රු.මිලියන 382.99 කට එනම් සියයට 42 ක ඇස්තමේන්තු ඉක්මවූ වටිනාකමකට ගිවිසුම් අත්සන් කර තිබුණි. 2014 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 254.5 ක් වටිනා විචලන නියෝගයන්ද කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබුණි. තවද, නව ගිවිසුමකට එළඹීමට කටයුතු නොකර රු.මිලියන 160.38 ක පිරිවැය වූ ගිවිසුමේ කාර්යයන්ට කෙලින්ම අදාල නොවූ කාර්යයන් පවත්නා කොන්ත්‍රාත්තුවේ විචලයන් ලෙස වර්ගීකරණය කර තිබූ අතර, ඒ සඳහා රු.මිලියන 32.08 ක් වූ වැඩ පූර්ව අත්තිකාරම් ගෙවා තිබුණි.

- කොන්ත්‍රාත්කරුවන්ගේ පහසුකම් සැපයීම සඳහා සමාලෝචිත වර්ෂයේදී මාසයකට රු.මිලියන 2.5 ක් බැගින් වූ මුදලක් ව්‍යාපෘතිය විසින් වැය කර තිබුණි. කෙසේ වූවද, ඒ පිළිබඳ කිසිදු ලිඛිත සාක්ෂියක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(v) 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ දක්වා ඇති පරිදි අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද සපුරා නොතිබූ ඉංජිනේරුවන් දෙදෙනෙකු හා ගණකාධිකාරීවරුන් දෙදෙනෙකු 2014 ජනවාරි 01 දින සිට ව්‍යාපෘතිය සඳහා බඳවා ගෙන තිබුණි. එමෙන්ම ව්‍යාපෘතිය විසින් කෙටි කාලයක් සඳහා උපදේශකවරු දෙදෙනෙකු බඳවා ගෙන තිබුණි. කෙසේ වූවද, ඔවුන් සඳහා කිසිදු නිශ්චිත පැවරුමක් හෝ රාජකාරී ලැයිස්තු ආදිය නිකුත් කර නොතිබුණි. තවද එක් උපදේශකවරයකු ප්‍රසම්පාදන විශේෂඥගේ ප්‍රසම්පාදන සහකරු ලෙස මාස 68 ක් සේවය කර තිබුණි.

(vi) පසුගිය වර්ෂයන්ට අදාල විගණන වාර්තාවලින් පහත සඳහන් කරුණු පෙන්වා දී තිබුණද, 2014 දෙසැම්බර් 31 දින වන විටත් ඒවා නිවැරදි කිරීම සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

- සේනානායක සමුද්‍රය, සමනල වැව හා වික්ටෝරියා ජලාශවල වේලි සම්බන්ධයෙන් පවත්නා ගැටළු පිළිබඳ විශේෂ අවධානයක් යොමු නොකිරීම.
- පොල්ගොල්ල උමගෙහි පිළියම් වැඩ පිළිබඳ පර්යේෂණ සිදුනොකිරීම.
- 2011 වර්ෂයේදී රු.123,776,014 ක පිරිවැයකට ( එකතු කළ අගය මත බදු හැර) 2WD සර්විස් මොබයිල් ට්‍රක් රථ 5 ක් මිලදී ගෙන තිබුණ අතර,

එම වාහන උපයෝජනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- මෙම ට්‍රක් රථ කලාතුරකින් භාවිතා කරනු ලබන බවත්, එම වාහන මිලදී ගත් 2011 අගෝස්තු මාසයේ සිට 2013 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය තුළදී එම ට්‍රක් රථ 05 න් 04 ක් ම ඉන්ධන පරිභෝජනය ලීටර 2.224.67 ක් පමණක් වූ බව නිරීක්ෂණය විය. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රඹෑව වැඩපලට අනුයුක්ත කර තිබූ ඉතිරි ට්‍රක් රථය සඳහා 2013 දෙසැම්බර් 31 දින වනවිට ඉන්ධන ලීටර 5,735 ක් භාවිතා කර තිබුණි.
- මෙම ට්‍රක් රථ 5 න් 3 ක් අරමුණු කළ කාර්යය වූ වේලි නඩත්තු කටයුතුවලට යෙදවීම වෙනුවෙන් වාර්මාර්ග දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික වැඩපොලවලට හා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අනුයුක්ත කර තිබුණි.
- ඉහත කී හේතු නිසා මෙම ට්‍රක් රථ ඌන උපයෝජිතව පැවති අතර, ඒ සඳහා වැය කළ ප්‍රසම්පාදන පිරිවැය හා එහි නඩත්තු කටයුතු වෙනුවෙන් කර තිබුණු වියදම් ආර්ථික නොවන හා ඵල රහිත වියදමක් වී තිබුණි.

- ව්‍යාපෘති කළමනාකරණ ඒකකය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය නියෝජනය කරමින් නිලධාරීන් තිදෙනෙකු 2012 අගෝස්තු 20 දින සිට 27 දින දක්වා ඇමරිකා එක්සත් ජනපදයේ පැවති ‘‘යූඑස්බීආර්’’ පුහුණු වැඩසටහනට සහභාගී වී තිබුණි. වැඩසටහනට සහභාගී වූ නිලධාරීන්ගේ සියළු නවාතැන් සහ සියළු ආහාර පාන සඳහා ගාස්තු සංවිධායකයන්ට ගෙවා තිබූ ලියාපදිංචි ගාස්තුව වූ එ.ජ.ඩො.11,400 තුළ අන්තර්ගතව තිබුණි. එම ගෙවීමෙහි අන්තර්ගතයන් සැලකිල්ලට නොගෙන ව්‍යාපෘතිය විසින් සහභාගී වූ නිලධාරීන්ට දීමනා ගෙවා තිබුණි. ඒ අනුව එක් නිලධාරියෙකුට එ.ජ.ඩො. 2,205 බැගින් නිලධාරීන් තිදෙනාට එ.ජ.ඩො. 6,615 ක් (රු.866,643) වැඩිපුර ගෙවා තිබුණි.

**(ඇ) වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය (අතිරේක මූල්‍යනය)**

මිණිපේ අන්තර් නිම්න ඇල මාර්ගය පුනරුත්ථාපනය කිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා දෙවැනි අවම ලංසුකරු විසින් තාක්ෂණික ඇගයීම් කාර්යයන් සඳහා අවශ්‍ය සියළු අවශ්‍යතා සම්පූර්ණ කර තිබුණද, තෙවන අවම ලංසුකරුට කොන්ත්‍රාත්තුව රු.මිලියන 430.84 කට ප්‍රදානය කර තිබුණි. ලංසු මිලෙහි වෙනස රු.මිලියන 7.55 ක් විය. ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් දක්වා තිබුණු අවම ලංසුකරුගේ පෙර දුර්වල කාර්යසාධනය හේතුවෙන් එම ලංසුව ප්‍රසම්පාදන කමිටුව විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. එහෙත් දුර්වලතාවයන් ලෙස දක්වා තිබුණු හේතූන් අනෙකුත් කොන්ත්‍රාත් සම්බන්ධයෙන්ද නිරීක්ෂණය වූ සාමාන්‍ය හේතූන් බව විගණනයේදී නිරීක්ෂණය විය. තවද, කොන්ත්‍රාත්තුව සඳහා ඉංජිනේරු ඇස්තමේන්තුව රු.මිලියන 300.54 ක් වූ අතර, ඇස්තමේන්තු පිරිවැයට සියයට 43 ක් වැඩි ලංසු වටිනාකමට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි.

## 3.11 කාර්යසාධනය

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්**

අමාත්‍යාංශය සිය අරමුණුවලට බැහැරව ක්‍රියා කළ අවස්ථා පහත දැක්වේ.

(අ) රාජ්‍ය ආයතන සඳහා චීන රජයෙන් පෙරසවි ගොඩනැගිලි ආනයනය කිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා සළසා තිබුණු රු.3,765,519,130 ක ප්‍රතිපාදනයෙන් 2014 වර්ෂයේදී රු.3,765,436,515 ක් වැය කර තිබුණි. 2015 අගෝස්තු 10 දින වන විටත් රාජ්‍ය ආයතනවලට සවිකර භාරදුන් මුලු නිවාස සංඛ්‍යාව, නිවාස භාරදුන් රාජ්‍ය ආයතන, එක් එක් ආයතනවලට භාරදුන් නිවාස සංඛ්‍යාව සතුටුදායක ලෙස සවිකළ බවට ආයතන ප්‍රධානීන්ගේ සහතික විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. එසේම මෙම කාර්ය වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ විෂය පථයට අයත් කාර්යයක් වී නොතිබුණු අතර එම කාර්යය සඳහා 2014 දෙසැම්බර් 31 දින වන විට රු.8,576,597,602 ක් වැය කර තිබුණි.

(ආ) සූක්ෂම වාරි පද්ධති ස්ථාපිත කිරීම හා ගොඩනැගිලි අළුත්වැඩියාව සඳහා මහවැලි උපදේශක සේවා කාර්යාංශය (පෞද්ගලික) සමාගමට රු.12,841,372 ක් අමාත්‍යාංශය විසින් ගෙවා තිබුණි. ප්‍රධාන හා මධ්‍යම වාරිමාර්ග යෝජනා ක්‍රමවල හදිසි යටිතල පහසුකම් පුනරුත්ථාපනයට ප්‍රතිපාදන සළසා තිබුණද, එම ප්‍රතිපාදන මොරගහකන්ද, රාජාංගනය, නිරාවිය ආදී ගොවිපලවල සූක්ෂම වාරි පද්ධති ස්ථාපනය කිරීම සඳහා රෙගුලාසිවලට පටහැනිව වියදම් කර තිබුණි. එසේම ඉහත සඳහන් සමාගමට මෙවැනි කාර්යයන් ඉටු කිරීමේ සුදුසුකමක් නොතිබුණත්, රජයේ ප්‍රසම්පාදන පටිපාටියෙන්ද බැහැරව එම කාර්යයන් අමාත්‍යාංශය විසින් එම සමාගම වෙත පවරා තිබුණි.

(ඇ) වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ කාර්යභාරයට අයත් නොවූ මහවැලි "බී" කලාපයේ වැලිකන්ද ප්‍රදේශයේ අලි වැටක් ඉදි කිරීම සඳහා රු.4,772,529 ක් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අමාත්‍යාංශය විසින් ගෙවා තිබුණි. මේ සඳහා ප්‍රධාන හා මධ්‍යම වාරිමාර්ග යෝජනා ක්‍රමවල හදිසි යටිතල පහසුකම් පුනරුත්ථාපනය සඳහා වාර්ෂික අයවැය ලේඛනයෙන් සළසා තිබුණු ප්‍රතිපාදන උපයෝගී කරගෙන තිබුණි.

(ඈ) උතුරු පළාත් ඇළ, මොරගහකන්ද හා කළු ගඟ යටිගං සංවර්ධන කටයුතු යන ව්‍යාපෘතිවලට ශක්‍යතා අධ්‍යයනය සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනවලින් රු.11,140,417 ක් වයඹ පළාත් ඇල ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයනයන් සඳහා 2014 වර්ෂයේදී භාවිතා කර එම වියදම් සදොස් ලෙස ඉහත කී ව්‍යාපෘතිවල වියදම් ලෙස ගිණුම් ගතකර තිබුණි. මෙම කාර්යය සඳහා මහවැලි උපදේශක සේවා කාර්යාංශය (පෞද්ගලික) සමාගමට කොන්ත්‍රාත් පිරිනැමීම රජයේ ප්‍රසම්පාදන පරිපාටියෙන් බැහැරව සිදු කර තිබුණි.

## 3.12 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

ප්‍රධාන හා මධ්‍යම වාරිමාර්ග යෝජනා ක්‍රම ප්‍රතිසංස්කරණය සඳහා අමාත්‍යාංශය වෙත සළසා තිබුණු රු.මිලියන 1,500 ක ප්‍රතිපාදනවලින් ජල සම්පත් මණ්ඩලයේ නළ ළිං ඉදිකිරීම, අළුත්වැඩියා කිරීම සහ දැයට කිරුළ සඳහා එකතුව රු.6,919,734 ක් වියදම් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1999 ඔක්තෝබර් 13 දිනැති අංක 1101/9 දරන රියදුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 7.2 වගන්තිය ප්‍රකාර වාරිමාර්ග දෙපාර්තමේන්තුවට සේවකයන් බඳවා ගැනීම වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් සිදු කළ යුතුව තිබුණද, රියදුරන් 75 දෙනෙකු බඳවා ගැනීම වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් විසින් සිදුකර තිබුණි.

(ආ) තවද ඉහත රියදුරු සේවා ව්‍යවස්ථාවේ 7.1 වගන්තිය ප්‍රකාර මෙවැනි බඳවා ගැනීමකදී අයඳුම්පත් කැඳවීම රජයේ ගැසට් පත්‍රය මඟින් හෝ ප්‍රසිද්ධ දැන්වීමක් මඟින් හෝ වෙනත් සුදුසු ආකාරයකට කළ යුතු වුවත් එයට පටහැනිව ඕනෑම

අපේක්ෂකයයෙකුට අයදුම්කිරීමට ඇති අවස්ථාව අහිමි කරමින් අදාල දැන්වීම වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලවල ප්‍රදර්ශනය කරන මෙන් ලේකම්වරයා විසින් වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් වෙත කරන ලද දැනුම්දීමක් මත මෙම බඳවා ගැනීමට අයදුම්පත් කැඳවා තිබුණි. මේ අනුව මෙම බඳවා ගැනීම රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් අනුමත කළ සුදුසු ක්‍රමයක් නොවන බව නිරීක්ෂණය විය.

**3.13 කළමනාකරණ දූර්වලතා**

වැව්වල රොන්මඩ ඉවත් කිරීමේ කාර්යයට යෙදවීමට මිලදී ගත් යන්ත්‍රෝපකරණ 80 ක් තිබියදී උමා ඔය පහළ නිම්න ව්‍යාපෘතියට හා මුරුන්කන් ප්‍රධාන නේවාසික ඉංජිනේරු කාර්යාලයට පෞද්ගලික සැපයුම්කරුවන්ගෙන් යන්ත්‍රෝපකරණ කුලියට ගැනීම වෙනුවෙන් රු.32,215,571 ක් ගෙවා තිබුණි.

**3.14 මානව සම්පත් කළමනාකරණය**

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 23 | 18 | 05 |
| (ii) | තෘතියික මට්ටම | 03 | 01 | 02 |
| (iii) | ද්විතියික මට්ටම | 89 | 51 | 38 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 44 | 41 | 03 |
| | එකතුව | **159** | **111** | **48** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වාර්ෂික අයවැය ඇස්තමේන්තුව පරිදි සමාලෝචිත වර්ෂයේ අනුමත සේවක සංඛ්‍යාව 679 ක් වුවද, අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන හා මුදල්) ගේ 2015 අගෝස්තු 05 දිනැති ලිපිය ප්‍රකාරව එය 159 ක් වූයෙන් 520 දෙනෙකුගේ වෙනසට හේතු පැහැදිලි නොකෙරුණි.

(ii) 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන

චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේදී ස්ථිර පත්වීම් ප්‍රදානය කළ සේවකයින්ගේ නාම ලේඛනයේ පිටපතක් 2015 පෙබරවාරි 26 දින විගණනය විසින් ඉල්ලා සිටියද 2015 අගෝස්තු 31 දින වන විටත් එම තොරතුරුද ලබා නොදුන් නිසා ඉහත තථ්‍ය සේවක සංඛ්‍යාවේ නිවැරදිතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.

**(ආ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ හා වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්**

අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේදී වෙනත් පාර්ශවයන්ට අවිධිමත් ලෙස මුදාහළ හා වෙනත් පාර්ශවයන්ගෙන් ලබා ගත් මානව සම්පත් පිළිබඳ විස්තර 2014 පෙබරවාරි 28 දින ඉල්ලා සිටියද, 2015 අගෝස්තු 31 දින වන විටත් එම තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. පසුගිය වර්ෂයේදී මහවැලි අධිකාරියට රියදුරන් දෙදෙනෙකු අවිධිමත් ලෙස මුදාහැර තිබුණ අතර සෞඛ්‍ය අමාත්‍යාංශයේ රියදුරන් 9 දෙනෙක් හා කම්කරුවන් තිදෙනෙක් අවිධිමත් ලෙස මෙම අමාත්‍යාංශයට අනුයුක්ත කර ගෙන තිබුණි.

## 4. ශීර්ෂය 282 - වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### 4.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|
| බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 | පවත්වා නොතිබුණි. |
| දෙපාර්තමේන්තු විසර්ජන (සම්මත වැය) ලෙජරය | මුදල් රෙගුලාසි 447(7) | යාවත්කාලින කර නොතිබුණි. |
| හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | යාවත්කාලින කර නොතිබුණි. |

**4.2 විගණන සාක්ෂි නොවීම**

දෙපාර්තමේන්තුව විසින් මුදල් රෙගුලාසි 272(2) ප්‍රකාරව කටයුතු නිම නොකළ 2011, 2012 හා 2014 වර්ෂයන්ට ආදාළ එකතුව රු.1,061,357 ක් වටිනා ගෙවීම් වවුචර් 8 ක් අස්ථානගත වී තිබුණි.

**4.3 විගණන විමසුම්වලට පිළිතුරුදීම**

දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 02 කට සහ ඉකුත් වර්ෂයට අදාළව නිකුත් කළ විගණන විමසුම් 02 කට 2015 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

**4.4 විසර්ජන ගිණුම**

**වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා කාර්යාල විසින් ලබා දුන් ප්‍රතිපාදන**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ 02 ක් හා දෙපාර්තමේන්තු 02 ක් විසින් එකතුව රු.1,377,564,987 ක් වු ප්‍රතිපාදන දෙපාර්තමේන්තු වෙත ලබා දි තිබුණු අතර එම ප්‍රතිපාදනවලින් පිළිවෙලින් රු.971,325,999 ක් හා රු.5,281,898 ක් වශයෙන් එකතුව රු.976,607,897 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉතිරිය පිළිවෙලින් රු.377,728,988 ක් හා රු.23,228,102 ක් වශයෙන් එකතුව රු.400,957,090 ක් හෙවත්, ලබා දි තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 28 ක හා සියයට 81 ක පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ලබා දී තිබුණු ප්‍රතිපාදනවලින් රු.3,842,062 ක් හෙවත් සියයට 77 ක් සහ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලබා දී තිබුණු ප්‍රතිපාදනවලින් රු.19,386,039 ක් හෙවත් සියයට 82 ක් අදාළ කාර්යයට යොදා නොගෙන ඉතිරි කර තිබුණි.

(ආ) වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයෙන් ගිං ගඟ නිල්වලා කටයුතු සඳහා ශක්‍යතා අධ්‍යයනයක් කිරිමට ලබා දී තිබුණු රු.5,235,000 ක ප්‍රතිපාදනය රු.2,255,345 කින් ඉක්මවා රු. 7,490,345 ක් උපයෝජනය කර තිබුණි.

**4.5 පොදු තැන්පත් ගිණුම**

**-----------------------**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

**(අ)** වර්ෂ 02 ක් ඉක්මවූ රු. 54,224,093 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ආ)** මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව ඉකුත්වූ සියලුම තැන්පත් පිළිබඳව අර්ධ වාර්ෂික ලැයිස්තු පිළියෙළ කර නොතිබුණි.

**4.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

**------------------------------------------------------------------------**

විෂය අංක 28201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 23,790,099 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 20 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ ශේෂයත් දෙපාර්තමේන්තු පාලන ගිණුමේ ශේෂයත් අතර රු.462,976 ක වෙනසක් පැවැතුණි.

(ඇ) කොළඹ දිස්ත්‍රික් වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලයේ උත්සව සහ විශේෂ අත්තිකාරම් ණය ලේඛනවල සඳහන් ණය ශේෂ හා සැසඳුම් ප්‍රකාශයේ සඳහන් ණය ශේෂ අතර රු.121,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 10 දෙනෙකුගෙන් එකතුව රු.942,261 ක් අයවිය යුතුව පැවතුණි. 2010 හා 2013 වර්ෂවලදී පළාත් සභා කාර්යාලවලට ස්ථාන මාරුවීම් ලබා ගිය නිලධාරීන් තිදෙනෙකුගේ ණය මුදල් වාරික වශයෙන් අයවන අතර රු.128,880 ක් තවදුරටත් අයවිය යුතුව තිබුණි.

(ඉ) වැටුප් රහිත නිවාඩු මත විදේශ ගත වූ නිලධාරීන් තිදෙනෙකුගෙන් රු.151,615 ක් අයවිය යුතුව පැවති අතර ඉන් නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු146,240 ක් වර්ෂ 19 ක කාලයක සිට හා තවත් නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු. 5,375 ක් වර්ෂ 13 ක කාලයක සිට හිඟහිටව පැවතුණි. නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය

යුතු රු.32,175 ක ආපදා ණය මුදල, මුදල් රෙගුලාසි 113 ප්‍රකාරව පොත්වලින් කපා හැරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව පසුගිය වර්ෂයේ වාර්තා කර තිබුණද එම ශේෂ කපා හැරීමට හෝ පියවා ගැනීමට දෙපාර්තමේන්තුව සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අපොහොසත් වී තිබුණි.

(ඊ) මිය ගිය හා විශ්‍රාම ගිය නිලධාරීන්/සේවකයන් 242 දෙනෙකුගෙන් අයවිය යුතු රු.20,542,289 ක ණය ශේෂයක් 2014 දෙසැම්බර් 31 දිනට අයවීම් නතරව පැවතුණි. ණය ශේෂ පියවා ගැනීමට අදාල විශ්‍රාම වැටුප් පාරිතෝෂිතය ප්‍රමාණවත් නොවීම, විශ්‍රාම ලිපි ගොණුවල අඩුපාඩු නිසා විශ්‍රාම වැටුප් සකස් කිරීමට නොහැකි වීම, රජයේ නිවාස භාර නොදීම, විනය පරීක්ෂණ අවසන් නොවීම වැනි දෙපාර්තමේන්තුවේ පරිපාලන දුර්වලකම් මත මෙම ණය ශේෂ පියවා ගැනීම ප්‍රමාදවී තිබුණි. පසුගිය වසරේ විගණන වාර්තාව මගින්ද මෙම තත්ත්වය පෙන්වා දී තිබුණත් ණය ශේෂ පියවා ගැනීමේ ප්‍රගතිය පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

(උ) වැඩ තහනමට ලක්වූ නිලධාරීන් 13 දෙනෙකුගෙන් එකතුව රු.562,891 ක ණය ශේෂ අයවිය යුතුව තිබුණු අතර එම ණය ශේෂ අතර වර්ෂ 20 කට වඩා පැරණි ණය ශේෂයන්ද පැවතුණි.

(ඌ) සේවය හැර ගිය නිලධාරීන් 33 දෙනෙකුගෙන් එකතුව රු.1,589,543 ක ණය ශේෂයක් අයවිය යුතුව තිබුණි. ඒ අතර වර්ෂ 19 ක් තරම් දීර්ඝ කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂයන්ද පවතින බව නිරීක්ෂණය විය. මෙම ණයකරුවන්ගෙන් අයවිය යුතු ණය ශේෂ ඔවුන්ගේ දේපලවලින්, ඇපකරුවන්ගෙන් හෝ උරුමක්කරුවන්ගෙන් හෝ අය කර ගැනීමට දෙපාර්තමේන්තුව විසින් කාලීනව ක්‍රියාමාර්ග නොගැනීම නිසා දීර්ඝ කාලයක් තිස්සේ මෙම ණය ශේෂ හිඟහිටව පැවතුණි.

## 4.7 වත්කම් කළමනාකරණය

---------------------------

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව දෙපාර්තමේන්තුව සතු රජයේ

නිවාස 265 ක පදිංචියට නිලධාරින් ඉදිරිපත් නොවීම සහ ඒවා අබලන්ව පැවතීම යන හේතු මත දීර්ඝ කාලයක සිට එම නිවාස භාවිතයට යොදා ගෙන නොතිබුණි.

(ii) පදවිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයෙහි පැවති තුවක්කු 27 ක් එස්.ජී. පතරොම් 83 ක් හා රයිපල් 272 ක් වසර 25 කට වැඩි කාලයක් මුළුල්ලේ භාවිතයට ගෙන නොතිබූ අතර ඒවා අපහරණය කිරීමටද කටයුතු කර නොතිබුණි.

(iii) පදවිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයෙහි පැවති රක්ෂිත මායිම් කණු (කොන්ක්‍රීට්) 1,540 ක් සහ ගංවතුර මායිම් කණු 806 ක් වසර 02 කට වැඩි කාලයක් මුළුල්ලේ භාවිතයට ගෙන නොතිබුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2015 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, වාරිමාර්ග කාර්යාල 14 කින් 2015 මැයි 31 දින වන විටත් එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**(ii)** 2013 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත, ඌනතා හා කරන ලද වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

**(ඇ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

දෙපාර්තමේන්තුව විසින් ඇතැම් වත්කම් අවිධිමත් ලෙස බාහිර පාර්ශවයන් වෙත මුදාහැර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

(i) 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවල සඳහන් පරිදි දෙපාර්තමේන්තුව සතු නිල නිවාස 16 ක අනවසර පුද්ගලයින් පදිංචිව සිටියද ඔවුන් ඉවත් කිරීම සඳහා නීත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි.

(ii) නිල නිවාස 42 ක් රජයේ වෙනත් දෙපාර්තමේන්තු හා ආයතන වෙත විධිමත් පරිදි

පැවරීමකින් තොරව ලබා දී තිබුණු බව 2014 වාර්ෂික ගබඩා භාණ්ඩ සමීක්ෂණ වාර්තා වල සඳහන්ව තිබුණි.

**(ඇ) බේරුම් නොකළ බැරකම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දෙපාර්තමේන්තුව විසින් 2014 දෙසැම්බර් 31 දින වන විට වර්ෂයකට වඩා අඩු කාලයක සිට බේරුම් නොකළ බැරකම් රු.433,752,223 ක් වී තිබුණි.

(ii) මුදල් රෙගුලාසි 94 ට පටහැනිව විෂයයන් 29 ක ශුද්ධ ප්‍රතිපාදනය ඉක්මවා රු.422,034,602 ක බැරකම්වලට එළඹ තිබුණි.

(iii) මුදල් රෙගුලාසි 447(4) විධිවිධාන ප්‍රකාරව සියලුම බැරකම් වැය ලෙජරයේ දැක්විය යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් එකඟ වී ඇති බැරකම් පිළිබඳ විස්තර වැය ලෙජරයට ඇතුළත් කර නොතිබුණි.

(iv) නියැදි විගණන පරීක්ෂාවේදී රු.7,452,533 ක් වටිනා බැරකම් ගිණුම්වල හෙළිදරව් කර නොතිබුණි.

## 4.8 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| මුදල් රෙගුලාසි 272 (3) | - | වාරිමාර්ග කාර්යාල 19 කට අදාළ 2014 වර්ෂයේ ගෙවීම් වවුචර් 2015 මාර්තු මාසය වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

(ආ) **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරන චක්‍රලේඛයේ 2 ඡේදය | 250,000 | නිලධාරියෙකුට හිමි උපරිම ආපදා ණය මුදල මාස 10 ක ඒකාබද්ධ වැටුප හෝ රු.250,000 ක් හෝ යන දෙකෙන් අඩු මුදල විය යුතු වුවද නිලධාරියෙකුට එම සීමාව ඉක්මවා ණය මුදලක් ගෙවා තිබුණි. |

## 4.9 දේශීය මුල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිමනොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

**(අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම**

දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය<br>රු. | ආරම්භ කළ යුතු වූ දිනය | ආරම්භ නොකිරීමට හේතු කෙටියෙන් |
|---|---|---|---|
| IT/T/SSC/2013/65<br>Construction of Canal Regulator in Paranamagama ela FC 06 and FC 07 at Yodha wewa | 818,792 | 2013.09.18 | ජලය නතර කර කෙටි කාල සීමාවක් තුළදී ඉදිකිරීම් කළ යුතු නමුත් ගොවි සංවිධානයේ අභ්‍යන්තර අර්බුදයක් මත වැඩ ආරම්භ කර නොතිබුණි. |
| EBD/O&M(SP)/UME/42/2014<br>Construction of 40.0 m long Cannal lining at pannals Samagi FO FC in Uma Ela Scheme | 1,020,000 | 2014.06.18 | ගොවි සංවිධානය සතුවූ කෙත් ඇළ දෙපස ගොවි මහතුන්ගේ විරෝධය නිසා අදාල වැඩ ආරම්භ කර නොතිබුණි. |
| EBD/O&M(SP)/AMB/86/2014<br>Construction of Cannal lining for new distributor Cannal for Thawana FO at 0+000 km in second link cannel in Ambewela Scheme | 1,061,000 | 2014.08.04 | මෙම කර්මාන්තය අදාල ස්ථානයේ ඇළ මාර්ගය ගමන් කරන්නේ සමාගමකට අයත් තේ වත්තක් මැදින් වන අතර ඔවුන්ගේ විරෝධතාවය හේතුවෙන් කර්මාන්තය ආරම්භ |

| | | | |
|---|---|---|---|
| | | | කිරීමට නොහැකි වී තිබුණි. |
| EBD/MWKND/10/2013<br>Replacing Damaged Repair and Improvements of Hoist 800m in kande Ela Meepilimana wewa | 1,038,715 | 2013.08.14 | පසුගිය වර්ෂය තුළ පැවති වර්ෂාව හේතුවෙන් කන්දෙ ඇළ ජලාශයේ ජල මට්ටම වර්ෂය පුරාම අඩු නොවුන බැවින් කොන්ත්‍රාත්කරුට එය ඉටු කිරීමට නොහැකි වී තිබුණි. |
| හ/වාරි/ගොස/LAS/2013/113 (ගජබා)<br>Supplying and laving Precast hume pipe in LSA Programme | 199,629, | සඳහන් කර නොමැත | ගොවි සංවිධාන ඉල්ලීම මත ඇස්තමේන්තු පිළියෙල කර තිබුණු නමුත් ගොවි සංවිධානය මෙම කාර්යය ඉටු කර නොතිබුණි. |
| හ/වාරි/ගොස/LAS/2013/116 (සුහද)<br>Supplying and laving Precast hume pipe in LSA Programme | 212,720 | සඳහන් කර නොමැත | ගොවි සංවිධාන ඉල්ලීම මත ඇස්තමේන්තු පිළියෙල කර තිබුණු නමුත් ගොවි සංවිධානය මෙම කාර්යය ඉටු කර නොතිබුණි. |
| හ/වාරි/ගොස/මෙන/2014/33<br>Improvenents to SLB CPO 35 and SLB CPO 36 cannel | 124,135 | සඳහන් කර නොමැත | ගොවි සංවිධාන බල ප්‍රදේශයේ වගා කන්නය ප්‍රමාදවී ආරම්භ කිරීම හේතුවෙන් එම කාලය තුලදී කර්මාන්තය ඉටුකිරීමට නොහැකිවීම |

**(ආ) ව්‍යාපෘති නිමනොකර අත්හැර දැමීම්**

දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර තිබුණත් එම ව්‍යාපෘති නිම නොකර අතහැර දමා තිබුණි.

| **ව්‍යාපෘතිය** | **ඇස්තමේන්තුගත පිරිවැය** | **ආරම්භ කළ දිනය** | **2014 දෙසැම්බර් 31 දින වන විට වියදම** | **අත්හැර දැමීමට හේතු** |
|---|---|---|---|---|
| | | | **රු.** | |
| **IE/T/SSC/2012/125**<br>Construction of Canal lining at 3+730 km Lunugamwehera LBMC | 1,612,650 | 2012.10.15 | 1,150,296 | ජලය නිකුත් කිරීමෙන් පසු පහළ ප්‍රදේශයේ සේදීයාමක් සිදු නොවූ නිසා දැනට මෙම |

| | | | | |
|---|---|---|---|---|
| | | | | ඉදිකිරීම් අවසන් වූ ලෙස සළකා ඇත. |
| **IE/T/SSC/2012/166** Improvenents Diyasyayaya Basnawa in Thissa Tank Sceme<br><br>( | 286,370. | 2012.11.05 | 99,679 | ඉදිකිරීම් මන්දගාමීව සිදුකර ඇති අතර ඇල කණ්ඩිය සකස් කර අවසන් වන විට ජලය නිකුත් කිරීම ආරම්භ වීම නිසා මුර වතුර කාල සීමාව තුළ ඉතිරි ඉදිකිරීම් සිදු කිරීමට උපදෙස් ලබා දී තිබුණත් ගොවි සංවිධානය විසින් පවත්නා බෝක්කුව මේ සඳහා ප්‍රමාණවත් බවත් ඇළ ශුද්ධ කිරීමෙන් පසුව ගැටළුව විසඳා ඇති බවත් දන්වා තිබීම. |
| **IE/T/SSC/2013/02** Rehabilitation of DC 03 From 1+300 km to 3+090 in RB Tract in Thissa Division | 1,237,702 | 2013.01.21 | | -ඉදිකිරීම් කර ගෙන යාමේදී කොන්ත්‍රාත්කරු හා ගොවි සංවිධානය අතර ඇතිවූ ආරවුලක් නිසා කර්මාන්තය අතර මඟදී නතර කර තිබීම. |
| **IE(HAM)MS/RUH UNUPURA/2014/07** Construction of Retaining wall for NCB cannal from 200m to 350m (L.B.side) Ridiyagama scheme | 1,975,012 | | | -ජලය නිකුත් කිරීම |

**(ඇ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘති ඉටුකිරීමේ දී පහත සඳහන් පරිදි ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ දිනය | නිම කළ යුතු දිනය | නිම කළ දිනය | 2014 දෙසැම්බර් 31 දිනට වියදම | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|---|
| | | | | | රු. | |
| EDB/EI/RRMI/AMB/53/2014 Construction of 30 m long Cannal lining at 1+200 km in RB main cannel (part 2) in Ambewela Scheme | 746,000 | 2014.07.07 | 2014.09.21 | 2014.12.05 | - | ඉදිරිපත් කර නැත |
| EDB/EI/RRMI/AMB/54/2014 Construction of 30 m long Cannal lining at 1+230 km in RB main cannel (part 2) in Ambewela Scheme | 733,000 | 2014.07.07 | 2014.09.21 | 2014.12.03 | - | ඉදිරිපත් කර නැත |
| EDB/EI/RRMI/AMB/55/2014 Construction of 30 m long Cannal lining at 1+260 km in RB main cannel (part 2) in Ambewela Scheme | 746,000 | 2014.07.07 | 2014.09.21 | 2014.12.03 | - | ඉදිරිපත් කර නැත |
| EDB/O&M(SP) DMW/72/2014 Construction of 96 m long Cannal lining along FC-01 LB main cannel Dambvinna Scheme | 976,000 | 2014.07.25 | 2014.10.03 | - | - | ඉදිරිපත් කර නැත |
| HD/HO/LUNUPOTHTHAWA TANK/2014/1 Construction of Lunupoththawa Tank | 7,424,810 | 2104.09.01 | - | - | 343,110 | මෙම කර්මාන්තයේ සැලැසුම්වල අත්තිවාරමේ නිර්මාණවල ඇති අඩුපාඩු නිසා කර්මාන්තයේ වැඩ කරගෙන යාමට නොහැකි වීම. |
| HD/HO/HELAMULLA | 8,498,810 | 2014.09.01 | - | - | 1,699,763 | පසුගිය දිනවල ප්‍රතිපාදන |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| TANK/2014/1 Construction of HelamullaTank | | | | | | නොමැති වීම නිසා නතර කර තිබුණි. දැනට වැඩ ආරම්භ කර ඇත. |
| RBW/W/UO/CATCH/ROSSET/BD)/03/2014 Construction of Rossetwaththa Tank | 3,260,580 | 2014.09.01 | - | - | - | රොසට් වත්තේ පදිංචිකරුවන් විසින් වැව සෑදීමට දක්වන ලද විරෝධතාවය නිසා මෙම කර්මාන්තයේ වැඩ කොටසක් දැනට නතර කර ඇත. |

## 4.10 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

----------------------------------

දෙපාර්තමේන්තුව විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) ජල ශක්ති අංශයේ සේවය කර 2002 මැයි 09 දින අනිවාර්ය විශ්‍රාම ගන්වන ලද ගබඩා භාරකරුවකුගේ 2002 වර්ෂයට පෙර සේවා කාලයේදී සිදුව තිබූ මිණුම් උපකරණ ඌණතාවයේ වටිනාකම රු. 4,313,239 ක් ලෙස වාර්තා කර තිබූ අතර මේ සම්බන්ධයෙන් පවරන ලද නඩුවේ තීන්දුව අනුව රු.411,051 ක මුදලක් පමණක් ඔහුගෙන් අය කරගෙන තිබුණි. මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාර මාස 03 ක් ඇතුළත ඉදිරිපත් කළයුතු පූර්ණ වාර්තාවද ඉදිරිපත් කිරීමට 2015 අගෝස්තු 31 දින දක්වාම අපොහොසත්වී තිබුණි. වසර 13 කට පෙර සිදුව තිබූ මෙම ඌණතාවය අයකර ගැනීම පිළිබද පසුවිපරම් කිරීමක් සිදු කර නොතිබුණි.

(ආ) ප්‍රධාන කාර්යාලයේ සේවයේ නියුතු වාරිමාර්ග අධ්‍යක්ෂ (යාන්ත්‍රික) රුසියාවේ විශ්ව විද්‍යාලයකින් ලබා ගත් උපාධියක් සුදුසුකම් ලෙස සලකා දෙපාර්තමේන්තුවට බඳවාගෙන තිබුණි. නිලධාරියා තමා වරලත් ඉංජිනේරුවයකු බව ප්‍රකාශ කරමින් ඔස්ට්‍රේලියානු ඉංජිනේරු ආයතනයේ සාමාජිකත්ව සහතිකයක් ඉදිරිපත් කර තිබුණි. එම සහතිකය පදනම් කර ගෙන ඔහුට ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව II පන්තියට උසස්වීම් ලබා දී 2014 වර්ෂයේදී I පන්තියට උසස් වීම් සඳහාද නිර්දේශ කර තිබුණි. එහෙත් ඔහුගේ මූලික උපාධිය ශ්‍රී ලංකාවේ යාන්ත්‍රික උපාධියට සම කළ හැකිද යන්න දෙපාර්තමේන්තුව විසින් සනාථ කරගෙන නොතිබුණි. එසේම නිලධාරියා ඔස්ට්‍රේලියානු ඉංජිනේරු ආයතනයේ වරලත්

ඉංජිනේරු සාමාජිකත්වය ලබා ගෙන නොමැති බව විගණනයේදී සනාථ විය. මේ අනුව එම නිලධාරියා යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකු ලෙස දෙපාර්තමේන්තුවට බඳවා ගැනීම මතභේදාත්මක වන අතර බඳවා ගැනීමෙන් පසු ලබාදී ඇති ඇති සහ 2014 දෙසැම්බර් 31 දින වන විට නිර්දේශ කර ඇති සියලුම උසස්වීම් සඳහා නියමිත සුදුසුකම් සපුරා නොමැති බවද නිරීක්ෂණය විය.

(ඇ) 2013 වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ තදුචිත කම්කරුවන් 04 දෙනෙකුට අනුග්‍රහ ත්‍රෛයි මාසික වාර ප්‍රවේශපත්‍ර ලබාගැනීම සඳහා ඔවුන් ලිපිකරුවන් යැයි සාවද්‍ය ලෙස ප්‍රකාශ කරමින් දුම්රිය දෙපාර්තමේන්තුවට ඉල්ලුම් පත්‍රයක් යොමු කර තිබූ අතර එම කූඨ ලේඛන සැකසීමේ චෝදනාව මත අදාල සේවිකාවන්ගේ සේවය අහෝසි කර තිබුණි. අයදුම්පත්‍ර නිර්දේශ කළ වාරිමාර්ග අධ්‍යක්ෂකට (යාන්ත්‍රික) එරෙහිව විධිමත් විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 4.11 අවිධිමත් ගනුදෙනු

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

### (අ) අධිකාර බලය නොමැති වූ ගනුදෙනු

තාවකාලික, අනියම් (දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත වාරිමාර්ග දෙපාර්තමේන්තුවට බඳවාගෙන ඇති සේවකයින් යැයි ප්‍රකාශ කරමින් 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාර සේවකයින් 1,686 දෙනෙකුට 2014 වර්ෂයේදී ස්ථිර පත්වීම් ප්‍රදානය කර තිබුණි. මේ සම්බන්ධයෙන් සිදුකළ විගණන පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) උක්ත චක්‍රලේඛයේ පළමු ඡේදය ප්‍රකාරව ස්ථිර පත්වීම් ප්‍රදානය කළ යුත්තේ දෙපාර්තමේන්තුවට බඳවාගෙන ඒ වන විටත් සේවයේ යෙදී සිටින සේවකයන්ට වුවද, විධිමත් පත්වීම් ලිපි මගින් සේවයට බඳවාගෙන සිටි බවට සනාථ නොවූ සේවකයින්ද ස්ථිර කර තිබුණි. ඉන් වැඩි පිරිසක් තදුචිත පදනම මත (ad hoc) සේවයේ යොදවා තිබීම හේතුවෙන් ඉහත චක්‍රලේඛයෙන් ඔවුන් ආවරණය නොවන බවත් ඒ අනුව ඔවුන් සේවයේ ස්ථිර කළ නොහැකි බවත් නිරීක්ෂණය විය.

(ii) උක්ත චක්‍රලේඛයේ 02 ඡේදය ප්‍රකාරව 2014 ඔක්තෝබර් 24 දිනට අඛණ්ඩව

දින 180 ක සේවා කාලයක් සම්පූර්ණ කර නොතිබූ සේවකයින් 16 දෙනෙකුට එම අඩුපාඩුව නොසළකා ස්ථිර පත්වීම් ප්‍රදානය කර තිබූ බව නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය විය.

(iii) 2013 ජනවාරි 30 දිනැති අංක 03/2013 (පාලන 04) දරන වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය ප්‍රකාරව බඳවා ගනු ලබන සියලුම තදුපිත සේවකයන් උපරිම මාස 5 ක් සේවයේ යොදවා ගෙන සේවා ඛණ්ඩනයක් සිදු කර තිබුණි. එවැනි සේවකයන්ට උක්ත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 ඡේදය ප්‍රකාරව අඛණ්ඩ සේවා කාලයක් පැවතිසේ සළකා ස්ථිර පත්වීම් ප්‍රදානය කර තිබුණි.

(iv) ඉහත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාර සේවකයින්ට ස්ථිර පත්වීම් ප්‍රදානය කළ යුත්තේ බඳවාගත් තනතුරු වල වුවද එම විධිවිධාන උල්ලංඝනය කරමින් තදුපිත කම්කරුවන් ලෙස බඳවාගත් සේවකයින් ලිපිකරු, සැලසුම් සහායක, තාක්ෂණ සහායක, ගබඩා සහායක, රියදුරු, කාර්මික ශිල්පී වැනි තනතුරුවලට ස්ථිරව පත්කර තිබුණි. 2015 මාර්තු 18 දිනැති අංක DMS/1217/VII දරන කළමණාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියෙන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධානයන්ට පටහැනිව ස්ථිර කිරීම් කර ඇති බවත් එම වරද නිවැරදි කර වාර්තා කරන ලෙසත් වාරිමාර්ග අධ්‍යක්ෂ වෙත දැනුම් දී තිබුණි. ඒ සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. 2013 මාර්තු 24 දිනැති අංක EST-4/PEMNT/0227 දරන ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියෙන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන ඉක්මවා කටයුතු කිරීමට අධ්‍යක්ෂ ජනරාල්ට හැකියාව නැති බව දන්වා තිබුණි.

(v) වාරිමාර්ග දෙපාර්තමේන්තු බඳවා ගැනීමේ පරිපාටිවල විධිවිධාන ප්‍රකාරව බඳවා ගැනීමේ උපරිම වයස් සීමාව අවුරුදු 45 වුවද එම වයස් සීමාව ඉක්මවූ සේවකයින් කම්කරු, ග්‍රිසර්, ජල පාලක, මුරකරු, කාර්මික ශිල්පී, පැස්සුම්කරු, වැද්දුම්කරු, වඩු කාර්මික, තහඩු වැඩකරු, පෙදරේරු වැනි තනතුරු වලට ස්ථිර කර තිබුණි. මේ අතර අනිවාර්ය විශ්‍රාම ගැනීමේ සීමාවට ආසන්න වූ වයස අවුරුදු 55 ක සිට 58 ක් දක්වා කාල පරාසයක සේවකයෝද වූහ.

(vi) 2013 ජනවාරි 08 දිනැති අංක DMS/G2/56/15/01/(vol.1) දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ දෙපාර්තමේන්තු සේවක සංඛ්‍යාව අනුමත කරන ලද ලිපිය මඟින් දෙපාර්තමේන්තුවේ ද එකගත්වය මත ලිපිකරු තනතුරු අහෝසිකර තිබුණි. ඒ පිළිබදව අවධානය යොමු නොකර දෙපාර්තමේන්තුව තුළ සේවය කළ සේවකයින් 181 දෙනෙකු ලිපිකරු තනතුරේ ස්ථිර කර තිබුණි.

(vii) 2013 ඔක්තෝබර් 11 දිනැති අංක අමප/13/1166/508/017 දරන අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව වසරක පුහුණු කාල සීමාවකින් පසුව ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරු පිරිනැමීමේ පදනම මත පුහුණුවන තාක්ෂණ සහායක තනතුරට 2014 පෙබරවාරි 14 දින සිට බඳවා ගෙන තිබුණු සේවකයින් 136 දෙනෙකුට බඳවා ගැනීමේ කොන්දේසි සියල්ල උල්ලංඝනය කරමින් ඉහත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය යටතේ ස්ථිර පත්වීම් ප්‍රදානය කර තිබුණි. මෙම සේවක පිරිස 2015 අගෝස්තු 31 දින දක්වා ගල්ගමුව වාරිමාර්ග අභ්‍යාස ආයතනයේදී යෝජිත පුහුණු පාඨමාලාවද සම්පූර්ණ කර නොතිබුණි.

## 4.12 වංචනික ස්වරූපයේ ගනුදෙනු

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ වංචනික ස්වරූපයේ ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

### (අ) ව්‍යාජ පත්වීම්

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් කූට ලේඛනය මත පදනම්ව පත්වීම් ලබාදීමට දෙපාර්තමේන්තුව කටයුතු කර තිබුණි.

(i) අම්පාර සහ මඩකලපුව වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලයන්හි ගබඩා සහකාර හා කම්කරු තනතුරු 15 කට පත්වීම් ප්‍රදානය කිරීමට අදාලව නිකුත් කර තිබූ පත්වීම් ලිපිවල දැක්වෙන අත්සන් හිටපු වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ගේ අත්සන හා නොසැසදෙන බවත් දෙපාර්තමේත්තුවේ ප්‍රධාන කාර්යාලයෙන් මෙවැනි පත්වීම් පිරිනැමීමක් සිදුකර නොමැති බවත් විගණනයේදී අනාවරණය විය. එම පත්වීම් ලිපිවල නිර්ව්‍යාජභාවය දෙපාර්තමේන්තුව විසින් තහවුරු කර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ii) පත්වීම් ලිපි සකස් කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ ලිපි ශීර්ෂය හා හිටපු වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ගේ නිල මුද්‍රාව යොදාගෙන තිබුණු නිසා එය දෙපාර්තමේන්තුවේ යම් නිලධාරීන් පිරිසක් විසින් සිදුකරන ලද කූඨ ලේඛන සකස් කර දූෂණ හෝ වංචනික ක්‍රියාවක් සිදු කර තිබුණු බව තහවුරු කර ගැනීමට අදාළ බලධරයන් වෙත අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම සඳහා යොමු කර නොතිබුණි.

**(ආ) ස්ථිර පත්වීම් ප්‍රදානය සඳහා කූඨ ලේඛන සැකසීම**

---

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 ඡේදය ප්‍රකාරව අඛණ්ඩව දින 180 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ සේවකයන් පමණක් ස්ථිර කළ යුතු වුවද හිරියාල, නාච්චාදූව, වාරියපොල, ඉගිණිමිටිය සහ මහනුවර ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයන්හි සහ කොළඹ ප්‍රධාන කාර්යාලයේ නියමිත දින ගණන සම්පූර්ණ නොකළ සේවකයින් 13 දෙනෙකු වෙත ස්ථිර පත්වීම් ප්‍රදානය කර තිබුණි. අපේක්ෂිත දින ගණන තහවුරු කිරීම සඳහා ව්‍යාජ තොරතුරු ඇතුළත් අයදුම්පත්, චර්යා සටහන් පත් හා ව්‍යාජ වෛද්‍ය වාර්තා, රෝග විනිශ්චය තුන්ඩු පිළියෙල කර තිබූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය වූ අතර, එම විගණන නිරීක්ෂණ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව ඉදිරි කටයුතු කිසිවක් කර නොතිබුණි.

(ii) සේවය කළ දින ගණන, ගෙවූ වැටුප, චෙක් රෝල් අංකය වැනි තොරතුරු ව්‍යාජව ඇතුළත් කර චර්යා සටහන් හා අයදුම්පත් පිළියෙළ කර දෙපාර්තමේන්තුව තුළ එක් දිනක් හෝ සේවය කර නොමැති සේවකයින් 07 දෙනෙකුට පදවිය හා හිරියාල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලවල සහ කොළඹ ප්‍රධාන කාර්යාලයේ සේවය ස්ථිර කර තිබූ බව නියැදි පරීක්ෂණවලදී අනාවරණය විය.

(iii) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් ආසියානු සංවර්ධන බැංකු ආධාර මත පුත්තලම හා හලාවත දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කරන ලද (දෙපාර්තමේන්තු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වූ) වියළි කලාපීය නාගරික ජල හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ තාක්ෂණික වැඩ පරීක්ෂකවරයෙකු ලෙස මාස 06 ක කොන්ත්‍රාත් පදනම මත සේවයේ

යොදවා ව්‍යාපෘති අරමුදලින් වැටුප් ගෙවන ලද සේවකයෙකු, දෙපාර්තමේන්තු සේවකයෙකු බවට ව්‍යාජ පත්වීම් ලිපියක් සකස් කර අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය යටතේ දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සහායක තනතුරේ සේවා ස්ථිරත්වය ප්‍රදානය කර තිබුණි.

**4.13 පාඩු හා හානි**

2014 දෙසැම්බර් 31 දිනට මුදල් වංචා අවස්ථාවන් තුනකින් එකතුව රු.475,033 ක් අයකර ගැනීමට තිබුණි. මෙම මුදල් වංචා සිදුවී වසර 5 ක සිට වසර 34 ක් දක්වා කාලයක් ගත වී තිබුණද, මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව අලාභය අයකර ගැනීමට හා පොත්වලින් ලියාහැරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. මෙම වටිනාකම රු.666,585 ක් ලෙස සදොස්ව විසර්ජන ගිණුමේ දක්වා තිබුණි.

**4.14 විසඳා නොතිබුණු විගණන ඡේද**

දෙපාර්තමේන්තුවට අදාලව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමු ගත විෂයය |
|---|---|---|
| **වර්ෂය** | **ඡේද අංකය** | |
| 2006 | 3.1 (අ) | සුගලා දේව්වැව ව්‍යාපෘතිය යටතේ ඉංජිනේරු සහකාරවරයෙකු සිදුකර ඇති අක්‍රමිකතා. |
| 2006 | 3.1 (ආ) | වෙලිඔය ව්‍යාපෘතිය යටතේ සිදුව ඇති අක්‍රමිකතා. |
| 2006 | 2.4.1 | ව්‍යාජ ලිපි ලේඛන ඉදිරිපත් කර දේපළ ණය ලබා ගැනීම. |
| 2006 | 7.2 (අ) | වෙහෙරගල ව්‍යාපෘතිය සඳහා කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රයක් මිලදී ගැනීම. |
| 2008 | 7 (ඇ) (1) | වාහනයක් අනතුරට පත්වීම නිසා රු.210,000 ක අලාභයක් සිදුවීම. |

## 4.15 කළමනාකරණ දුර්වලතා

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) 1946 අංක 32 දරන වාරිමාර්ග ආඥාපනත වර්තමානයට ගැලපෙන ආකාරයට සංශෝධනය කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි.

(ආ) 2013 වර්ෂයේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සේවක සංඛ්‍යාව ගැලපීමෙන් පසුව එම ප්‍රතිව්‍යුහගත කිරීමට අදාළව නිවැරදි සංවිධාන සටහනක් පිළියෙල කර නොතිබුණි. දෙපාර්තමේන්තුවේ සිවිල් හා යාන්ත්‍රික අධ්‍යක්ෂ තනතුරු 42 ක් පවතින අතර ඒ එක් එක් තනතුරට අදාළ රාජකාරී ලැයිස්තු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 4.16 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| **(i)** | ජ්‍යෙෂ්ඨ මට්ටම | 410 | 275 | 145 | 10 |
| **(ii)** | තෘතියික මට්ටම | 180 | 29 | 151 | - |
| **(iii)** | ද්විතියික මට්ටම | 2,799 | 2,330 | 638 | 169 |
| **(iv)** | ප්‍රාථමික මට්ටම | 3,060 | 3,756 | 194 | 890 |
| **(v)** | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | - | 272 | - | 272 |
| | එකතුව | **6,449** | **6,662** | **1,128** | **1,341** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) බඳවා ගෙන තිබුණු අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳව විධිමත් අනුමැතියක් ලබාගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(iii) ස්ථිර අනුමත සේවක සංඛ්‍යාව 6,449 ක් ලෙස වාරිමාර්ග අධ්‍යක්ෂ විසින් විගණනයට තහවුරු කර තිබුණද, එය 4,869 ක් ලෙස වාරිමාර්ග අධ්‍යක්ෂ විසින් 2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුවට ඇතුළත් කර තිබුණි. කෙසේ වුවද 1,580 ක් වූ වෙනසට හේතු පැහැදිළි කර නොතිබුණි.

(iv) 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය යටතේ ස්ථිර පත්වීම් ලබාදුන් සේවක සංඛ්‍යාව 1,686 ක් බව අධ්‍යක්ෂ ජනරාල්වරයා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට වාර්තා කර තිබුණද, විගණනයට ලබාදෙන දෙන ලද වාර්තාවක එය 1,728 ක් ලෙස සඳහන් කර තිබුණි. ඒ අනුව සේවකයන් 42 කුගේ වෙනසට හේතුව පැහැදිළි නොවුණි. එසේම බඳවා ගැනීමේදී සිදුව තිබුණු විෂමාචාර නිසා මෙම සේවක පිරිස දෙපාර්තමේන්තු අනුමත සේවක සංඛ්‍යාවට ඇතුළත් කර ගැනීමට නොහැකිව තිබුණි.

**(ආ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්**

දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී වෙනත් පාර්ශවයන්ට අවිධිමත් ලෙස මුදාහැර තිබුණු මානව සම්පත් පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

| සේවක වර්ගය | සංඛ්‍යාව | වෙනත් පාර්ශවය | මුදාහැර තිබුණු කාලපරිච්ඡේදය |
|---|---|---|---|
| **(i)** සැලසුම් ශිල්පී | 01 | ජනාධිපති විමර්ශන ඒකකය | සඳහන් නොවේ |
| **(ii)** සැලසුම් ශිල්පී | 01 | ජනාධිපති විමර්ශන ඒකකය | 2005 මාර්තු සිට |
| **(iii)** විදුලි සහකාර | 01 | ජනාධිපති විමර්ශන ඒකකය | 2001 මැයි සිට |
| **(iv)** විදුලි සහකාර | 01 | ජනාධිපති විමර්ශන ඒකකය | 2005 මාර්තු සිට |
| **(v)** සැලසුම් ශිල්පී | 01 | වාරිමාර්ග කළමනාකරණ අංශය | 2008 ජනවාරි සිට |
| **(vi)** සැලසුම් ශිල්පී | 01 | පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | 2013 ජනවාරි සිට |
| **(vii)** සැලසුම් ශිල්පී | 01 | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | 2013 ඔක්තෝබර් සිට |
| **(viii)** ඉංජිනේරු සහකාර | 01 | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | 2012 මාර්තු සිට |
| **(ix)** ඉංජිනේරු සහකාර | 01 | වාරිමාර්ග කළමනාකරණ අංශය | 2013 අප්‍රේල් සිට |
| **එකතුව** | **09** | | |